IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## මනෝවිද්‍යා උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව

## (ප්‍රථම සෙමෙස්තරය)

## (2018) 2019 ජූනි

## DCP 02 - සාමාන්‍ය මනෝවිද්‍යාව

අයදුම්කරුවන්ට උපදෙස් :

(6) ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සැපයිය යුතුය.

(7) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(8) කාලය පැය තුනයි. (03)

(9) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(10) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01.

i. වර්ධනය හා සංවර්ධනය අතර ඇති වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. මානව සංවර්ධනයට බලපාන සාධක සුදුසු උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු 10)

iii. සංවර්ධනය කෙරෙහි බලපාන ප්‍රධාන මූලධර්මයන් ලැයිස්තු ගත කර පුද්ගල සංවර්ධන කෙරෙහි ඒවායේ බලපෑම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

02.

i. බුද්ධිය යන සංකල්පය කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

ii. හොවාර්ඩ් ගාඩ්නර් ගේ බහුවිධ බුද්ධි න්‍යාය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

iii. පෙර පාසල් වයසේ දරුවන්ගේ 'වාචසික භාෂාමය බුද්ධිය' සහ 'ස්වභාවධර්ම බුද්ධිය' සංවර්ධනය කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු 10)

03.

i. 'චින්තනය' සහ 'ගැටලු නිරාකරණය' යන සංකල්ප දෙක විස්තර කරන්න.

(ලකුණු 05)

ii. ගැටලු නිරාකරණ ක්‍රියාවලියට බලපාන සාධක දෙකක් විස්තර කරන්න.

(ලකුණු 10)

iii. තරුණ පුද්ගලයකු තුළ නිර්මාණශීලී බව සංවර්ධනය කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

04.

i. 'චිත්තවේග' නිර්වචනය කරන්න.

(ලකුණු 05)

ii. 'චිත්තවේග' පිළිබඳව චාර්ල්ස් ඩාවින්ගේ මතය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

iii. එක්මන් හා ෆ්‍රීසන් චිත්තවේග සම්බන්ධව ඉදිරිපත් කළ 'විදහා දක්වන නීති' (Display rules) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

05.

i. අභිප්‍රේරණය යනු කුමක්ද?

(ලකුණු 05)

ii. ප්‍රේරක (Drives) හා පෙළඹවීම (Incentives) අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 10)

iii. විලියම් මැක්ඩුගල් ගේ ආශ න්‍යාය තුළ (Instinct Theory) අභිප්‍රේරණය හඳුන්වන්නේ කෙසේදැයි නිදසුන් සහිතව විස්තර කරන්න.

(ලකුණු 10)

06.

i. ජීව විද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක අභිප්‍රේරණය ලැයිස්තුගත කරන්න.

(ලකුණු 05)

ii. අභිප්‍රේරණය චක්‍රය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

iii. මස්ලෝ ගේ අවශ්‍යතා ධූරාවලිය පුද්ගල අභිප්‍රේරණය සඳහා කෙසේ බලපාන්නේ දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

****************************